රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 05/2001

මගේ අංකය: II/572/E/3
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2001 මාර්තු 8 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## විදුලිය අරපරිස්සමින් පාවිච්චි කිරීම

2001 පෙබරවාරි මස 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද (40 වන අධිකාරිය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 5 වන වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමිය විසින් පනවා ඇති 2001 අංක 01 දරණ හදිසි අවස්ථා (විදුලිබල භාවිතය හෝ පරිභෝජනය සීමා කිරීමේ) නියෝග කෙරේ ඔබගේ අවධානය යොමු කරනු ලැබේ

02. ඉහත සඳහන් හදිසි රෙගුලාසි පහත දක්වමි.

**රෙගුලාසි**

I මේ නියෝග, 2001 අංක 1 දරන හදිසි අවස්ථා (විදුලිබල භාවිතය හෝ පරිභෝජනය සීමා කිරීමේ)නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

II කිසිම තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි ඔහු ලංකා විදුලිබල මණ්ඩලය සමග හෝ සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම සමග හෝ යම් ගිවිසුමකට හෝ කොන්ත්‍රාත්තුවකට ඇතුළත්ව තිබුණේ වුවද, මේ නියෝග බලපවත්නා තාක් කල් සහ එම කාලය තුළදී -

අ) සැණකෙළි භූමි හා වෙළෙඳ සල්පිල භූමි ආලෝකනය හෝ ගොඩනැගිලි චතුරු ආලෝකනය,

ආ) නාම පුවරු, වෙළෙඳ කවුළු හෝ චතුර මල් ආලෝකනය හෝ

ඇ) වායුසමීකරණ ක්‍රියා කරවීම

සඳහා එම මණ්ඩලය හෝ සමාගම විසින් සපයනු ලබන විදුලිබලය භාවිතයට හෝ පරිභෝජනයට ගනු නොලැබිය යුතුය.

III. ඉහත 2 වන නියෝගයේ (අ), (ආ) හො ' (ඇ) ඡේදවල කුමක් සඳහන්ව තිබුණද, ඉහත සඳහන් කවර කාර්යයක් සඳහා වුවද යම් තැනැත්තකු විදුලි ජනක යන්ත්‍ර භාවිතයට ගැනීමෙන් විදුලි බලය සපයා ගැනීමට කැමැත්තේ නම්, ඒ තැනැත්තා විසින් එසේ කරනු ලැබිය හැකිය.

IV. අවස්ථාවෝචිත පරිදි, යම් තැනැත්තකුගේ පරිශ්‍රයට, ලංකා විදුලිබල මණ්ඩලය විසින් හෝ සීමාසහිත ලංකා විදුලිබල (පෞද්ගලික) සමාගම විසින් හෝ විදුලිබලය සපයනු ලබන්නා වූද ගෘහස්ථ විදුලිජනක යන්ත්‍රයක් භාවිත කරනු ලබන්නා වූ හෝ සන්තකයේ ඇත්තා වූද යම් තැනැත්තු විසින්, ඔහුගේ පරිශ්‍රයට එසේ විදුලිබලය සපයනුලැබුවේ වුවද හැකි සෑම අවස්ථාවකම, ඔහුගේ පරිශ්‍රයට විදුලබලය සපයා ගැනීම සඳහා ඒ ජනක යන්ත්‍රය භාවිතයට ගැනීම නොකඩවා කරගෙන යා යුතුය.

V. වීථි ලාම්පු සැපයීම සම්බන්ධ වගකීම ඇති ආයතන විසින් එක් එක් දිනයේදී එම ලාම්පු ප.ව.7'00 ට පමණක් දල්වනු ලබන බවට සහ ඊළඟ දින පෙ.ව.5.30 ට නිවා දමන බවට වග බලාගත යුතුය.

VI. මේ නියෝගවල විධිවිධාන කඩකරන යම් තැනැත්තකු පූර්ව දැනුම්දීමකින් තොරව තමන්ට සපයනු ලබන විදුලිබලය, අවස්ථාවෝචිත පරිදි, තාවකාලිකව විසන්ධි කරනු ලැබීමට හෝ අත්හිටවනු ලැබීමට යටත් වන්නේය.

03. විදුලි සැපයුමේ පවත්නා වර්තමාන හිඟකම සැලකිල්ලට ගනිමින් මෙම හදිසි නීති රෙගුලාසි ඔබ හා ඔබ පාලනය යටතේ පවත්නා ආයතන විසින් දැඩි ලෙස ක්‍රියාත්මක කරනු ලබන බවට සහතිකවීමේ අවශ්‍යතාවය අවධාරණය කරමි.

එම්.එන්. ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන/ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.